සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**50 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2014 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2014 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2014**

නාට්‍ය හා රංග කලාව I, II
நாடகமும் அரங்கியலும் I, II
Drama and Theatre I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

## නාට්‍ය හා රංග කලාව I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.

(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

● පහත දැක්වෙන පද්‍ය ආශ්‍රයෙන් අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) උත්තමවන් ලොව පතළා - එංගලන්ත නමින් යුතු විපුලා
තුංග සිරින් රැන්දු සකලා - දේස ලන්ඩන් පුරවර නිමලා

(ii) මහ මුහුදට නැව ඇවිත් බසින්නේ
මහ මුහුදේ නැව ගමනි බොලන්නේ
ගොළු මුහුදට නැව ඇවිත් බසින්නේ
ගොළු මුහුදේ නැව ගමනි බොලන්නේ

(iii) ඇත කඳුකර හිමව් අරණේ සීත චන්දන ළපලු සෙවණේ
සුළං රැල්ලේ පාව එන්නේ ඔහුගෙ නාමය වේ

(iv) ගුමු නාදේ දෙන බඹරගේ දොසිනා කරදර විය බොහො සේ
ඒ මල දාලා ආවේ ගුම් ගාලා මාගේ මූණ රිද්දා
වත මාගේ මල වාගේ එහි හංගේ එයි රිංගේ
මම කාට කියම්දෝ කරදර මේවා මාගේ මූණ රිද්දා

1. තුර්ති නාටකයකට අයත් පද්‍ය ඛණ්ඩය වන්නේ,
(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

2. උඩරට සොකරි ජන නාටකයට අයත් පද්‍ය වන්නේ,
(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

3. නාඩගම්වලට අයත් පද්‍ය ඛණ්ඩය වන්නේ,
(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

4. අමරදේවයන් විසින් සංගීතවත් කොට ගයනු ලබන්නේ,
(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

5. නලදමයන්ති මුද්‍රා නාට්‍යයට අයත් පද්‍ය ඛණ්ඩය වන්නේ,
(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

● නිවැරදි වරණය තෝරන්න.

6. වේදිකා නාට්‍යයක සුවිශේෂී ලක්ෂණය වන්නේ,
(1) කතාන්දරය ය. (2) සජීවීබව ය. (3) රූපණය ය. (4) උපදේශනය ය.

7. වේදිකා නාට්‍යයකට නැතිව ම බැරි දෙදෙනා වන්නේ,
(1) නිෂ්පාදක සහ අංග රචන ශිල්පියා ය. (2) පෙළ රචක සහ අර්ථපති ය.
(3) ආලෝකකරණ ශිල්පියා සහ වේෂ භූෂණ ශිල්පියා ය. (4) නළුවා සහ ප්‍රේක්ෂකයා ය.

8. නාට්‍යයක ප්‍රධාන අරමුණ වන්නේ,
(1) උපදේශනයයි. (2) රසෝත්පාදනයයි. (3) කතාන්දරයයි. (4) මනා රූපයයි.

[ දෙවැනි පිටුව බලන්න.

9. නාට්‍ය පෙළක් ප්‍රබල වීමට අවශ්‍ය වන්නේ,
(1) ගැටුම් අවස්ථා සහිත වීම ය. (2) රංග විධාන සහිත වීම ය.
(3) බොහෝ නාට්‍ය ගීත ඇතුළත් කර තිබීම ය. (4) ආනුෂංගික ශිල්පීන්ට අවශ්‍ය ඉඟි ලබාදීම ය.

10. නාට්‍යශාස්ත්‍ර ග්‍රන්ථයේ කර්තෘත්වය පවරනු ලැබ ඇත්තේ,
(1) ඇරිස්ටෝටල් වෙත ය. (2) අභිනවගුප්ත වෙත ය. (3) භරතමුනි වෙත ය. (4) නන්දිකේශ්වර වෙත ය.

11. නාට්‍යමය අවස්ථාවක් ලෙස සැලකෙන්නේ,
(1) නාට්‍යමය ගුණයෙන් පූර්ණ අවස්ථාවකි. (2) නාට්‍යයක් ආරම්භ වන අවස්ථාව ය.
(3) නාට්‍යයක් අවසන් වන අවස්ථාව ය. (4) නාට්‍යයේ ජවනිකා අවසන් වන අවස්ථාව ය.

12. නාට්‍ය නිෂ්පාදනයක දී වේදිකාව මත මැවෙන 'ප්‍රේක්ෂාව' පිළිබඳ වගකීම භාර ව සිටින්නේ,
(1) රංගභූමි පාලක ය. (2) රංගාලෝක ශිල්පියා ය.
(3) අංග රචනා ශිල්පියා ය. (4) පසුතල නිර්මාණ ශිල්පියා ය.

13. අභිරූපණ රංගයේ දී 'බාහිර ශිල්ප ක්‍රමය' යනු,
(1) මනසින් නිර්මාණය කරගත් සිද්ධිය සිරුර උපයෝගී කරගෙන ඉදිරිපත් කිරීමයි.
(2) රංගනයට අදාළ කර ගත් සිද්ධිය මනසින් සියුම් ව විග්‍රහ කිරීමයි.
(3) සහජ කුශලතාව මත ඉදිරිපත් කිරීමයි.
(4) සීමිත අවකාශය තුළ විවිධ අයුරින් ගමන් ක්‍රම යොදාගනිමින් ආංගික හා සාත්ත්වික අභිනය ගෙනහැර පෑමයි.

14. දර්පණ අභ්‍යාසවල යෙදීම නළුවාට,
(1) දීර්ඝ සංවාද ඛණ්ඩ නිවැරදි ව උච්චාරණය කිරීමට ඉවහල් වේ.
(2) ආහාර්ය අභිනයට අවශ්‍ය වේශභූෂණ සකසාගැනීමට ඉවහල් වේ.
(3) ශිථිලීකරණය සාක්ෂාත් කරගැනීමට උදවු වේ.
(4) සෘජු ව දැස් අතර සබඳතා පවත්වාගැනීමට උපකාරී වේ.

15. අංග රචනයේ දී මුහුණ මූලික වශයෙන් බෙදා දක්වන කොටස් සංඛ්‍යාව,
(1) හතකි. (2) හයකි. (3) පහකි. (4) හතරකි.

- පහත දැක්වෙන වගුව ආශ්‍රයෙන් අංක **16** සිට **20** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| ක | ග | ජ | ට |
|---|---|---|---|
| ඉබේ වෙදා<br>යන්තම් බේරුණා<br>පුදුම බේරිල්ල | පබාවතී<br>රත්තරන්<br>ජේමතෝ ජායති සෝකෝ | බෝඩිංකාරයෝ<br>ජනේලය<br>බෙර හඬ | සුබ සහ යස<br>දුන්න දුනුගමුවේ<br>කැලණි පාලම |

16. ඉහත වගුවේ 'ක' ගොනුවෙහි සඳහන් වන්නේ,
(1) ධම්ම ජාගොඩ විසින් රචනා කර අධ්‍යක්ෂණය කරන ලද නාට්‍ය තුනකි.
(2) ඇන්ටන් චෙකොව්ගේ නාට්‍ය ඇසුරෙන් අනුවර්තනය කරන ලද හැටේ දශකයේ නාට්‍ය තුනකි.
(3) විශ්වවිද්‍යාලයේ සිංහල සමිතිය මගින් රඟ දැක්වුණු නාට්‍ය තුනකි.
(4) හැත්තෑව දශකයේ ශ්‍රී ලංකාවේ රඟ දැක්වුණු නාට්‍ය තුනකි.

17. ඉහත වගුවේ 'ග' ගොනුවෙහි සඳහන් වන්නේ,
(1) අසූව දශකයේ මුලින් ම රඟ දැක්වූ නාට්‍ය වේ.
(2) ගුණසේන ගලප්පත්ති හා රංජිත් ධර්මකීර්ති විසින් අධ්‍යක්ෂණය කරන ලද නාට්‍ය තුනකි.
(3) අනුවර්තනය කරන ලද නාට්‍ය තුනකි.
(4) එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය තුනකි.

18. ඉහත වගුවේ 'ජ' ගොනුවෙහි සඳහන් වන්නේ,
(1) එක ම රචකයකු විසින් රචනා කරන ලද නාට්‍ය වේ.
(2) හැටේ දශකයේ නිර්මාණය කරන ලද නාට්‍ය වේ.
(3) ස්වතන්ත්‍ර නාට්‍ය රචනා තුනකි.
(4) බර්නාඩ් ෂෝගේ නිර්මාණ ආශ්‍රයෙන් පරිවර්තනය කරනු ලැබූ නාට්‍ය තුනකි.

19. ඉහත වගුවේ 'ට' කොටුවෙහි සඳහන් නාට්‍ය තුන,
(1) හැත්තෑව දශකයේ නිෂ්පාදනය වූ නාට්‍ය වේ.
(2) හැටේ දශකයේ නිෂ්පාදනය වූ නාට්‍ය වේ.
(3) ඓතිහාසික සිද්ධීන් පදනම් කරගත් නාට්‍ය වේ.
(4) පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් නිෂ්පාදනය කරන ලද නාට්‍ය වේ.

20. මෙහි සයිමන් නවගත්තේගම, සුගතපාල ද සිල්වා, ආර්. ආර්. සමරකෝන් යන නාට්‍යකරුවන් තිදෙනා නිර්මාණය කර ඇති නාට්‍ය අයත් ගොනුව වන්නේ,
(1) 'ක' ය. (2) 'ග' ය. (3) 'ජ' ය. (4) 'ට' ය.

[ තුන්වැනි පිටුව බලන්න.

- පහත දැක්වෙන වගුව ආශ්‍රයෙන් **21** සිට **25** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | | |
|---|---|---|---|
| පිරිත් පිංකම | දොරකඩ අස්න | සෑම ප්‍රදේශයක ම | ක<br>.......................... |
| රට යකුම | නානු මුරය | ග<br>.......................... | ගුරුන්නාන්සේ හා<br>ගැහැනු වෙස්ගත් ඇඳුරා |
| ජ<br>.......................... | දහඅට සන්නිය | පහතරට | යකැදුරා හා යක්ෂිණිය |
| ගම්මඩු/දෙවොල් | ට<br>.......................... | සබරගමු | කන්නගි/කෝවලන් |
| හූනියම් කැපීම | ඩ<br>.......................... | පහතරට | ඇදුරා සහ බමුණා |

21. 'ක' හිස්තැනට සුදුසු පිළිතුර කුමක් ද?
   (1) භික්ෂූන් වහන්සේ හා බෙරකරු  (2) භික්ෂූන් වහන්සේ හා දේවදූතයා
   (3) භික්ෂූන් වහන්සේ දෙනමක්  (4) භික්ෂූන් වහන්සේ හා ගුරුන්නාන්සේ

22. 'ග' හිස්තැනට සුදුසු පිළිතුර කුමක් ද?
   (1) උඩරට  (2) පහතරට  (3) සබරගමු  (4) රජරට

23. 'ජ' හිස්තැනට සුදුසු පිළිතුර කුමක් ද?
   (1) මරා ඉපැද්දීම  (2) දරු නැළවිල්ල  (3) අඹ විදමන  (4) සන්නි යකුම


24. 'ට' හිස්තැනට සුදුසු පිළිතුර කුමක් ද?
   (1) අඹ විදමන  (2) රාම මැරීම  (3) මරා ඉපැද්දීම  (4) ඌරා යක්කම

25. 'ඩ' හිස්තැනට සුදුසු පිළිතුර කුමක් ද?
   (1) ගුරුගේ මාලාව  (2) අඹ විදමන  (3) ගබඩා කොල්ලය  (4) වඩිග පටුන

- පහත දැක්වෙන ඡායාරූප ආශ්‍රයෙන් **26** සිට **28** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


ක


ග



ජ

26. මෙහි 'ක' ඡායාරූපයෙන් දැක්වෙන නාට්‍යකරු විසින් රචනා කරන ලද නාට්‍යයක් වන්නේ,
   (1) කැලණි පාලම ය.  (2) නරි බෑණා ය.  (3) මූදු පුත්තු ය.  (4) ස්වර්ණමාලී ය.

27. මෙහි 'ග' ඡායාරූපයෙන් දැක්වෙන රංගන ශිල්පියා වන්නේ,
   (1) එච්. ඒ. පෙරේරා ය.  (2) නීල් අලස් ය.
   (3) මාර්ක් ඇන්ටනි ප්‍රනාන්දු ය.  (4) ජෙරම් ලක්ෂ්මන් ය.

28. මෙහි 'ජ' ඡායාරූපයෙන් දැක්වෙන්නේ,
   (1) සන්ධ්‍යා කුමාරි ය.  (2) අයිරාංගනී සේරසිංහ ය.  (3) සුමනා අමරසිංහ ය.  (4) රුක්මණී දේවි ය.

- පහත දැක්වෙන ඡායාරූප ආශ්‍රයෙන් **29** වැනි ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.



29. මෙම ඡායාරූපයෙන් දැක්වෙන නාට්‍ය නිර්මාණය
   (1) බටහිර ඔපෙරා නාට්‍යයකි.
   (2) බැලේ නාට්‍යයකි.
   (3) පීකිං ඔපෙරා නාට්‍යයකි.
   (4) මුද්‍රා නාට්‍ය නිර්මාණයකි.

30. ප්‍රාසංගික කලා පමණක් අන්තර්ගත වන වරණය තෝරන්න.
   (1) මූර්ති ශිල්පය, සංගීතය, නවකතාව, ඔපෙරාව සහ නාට්‍යය
   (2) සාහිත්‍ය, නර්තනය, මුද්‍රානාට්‍යය, සිනමාව සහ නාට්‍යය
   (3) නර්තනය, සංගීතය, මුද්‍රානාට්‍යය, නාට්‍යය සහ ඔපෙරාව
   (4) ඔපෙරාව, චිත්‍ර කලාව, බැලේ, සිනමාව සහ නාට්‍යය

/ හතරවැනි පිටුව බලන්න.

31. ඩබ්ලිව්. බී. මකුලොළුව විසින් රචනා කරන ලද ගීත නාට්‍යයක් වන්නේ,
(1) දෙපානෝ ය. (2) කරදිය ය. (3) කැලෑමල් ය. (4) මිණි පළඟ ය.

● පහත දැක්වෙන වෙස් මුහුණු දෙක ආශ්‍රයෙන් **32** සහ **33** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



ක



ග

32. මෙහි දැක්වෙන වෙස් මුහුණු දෙකින්,
(1) 'ක' සන්නි මුහුණකි, 'ග' කෝලම් මුහුණකි.
(2) 'ක' කෝලම් මුහුණකි, 'ග' සන්නි මුහුණකි.
(3) 'ක' හා 'ග' කෝලම් මුහුණු දෙකකි.
(4) 'ක' හා 'ග' සන්නි මුහුණු දෙකකි.

33. මෙම වෙස් මුහුණු දෙක,
(1) මුදලි කෝලම සහ ආරච්චි කෝලම ය.
(2) පොලිස් කෝලම හා මූර්තු සන්නිය ය.
(3) අමුක්කු සන්නිය හා මුදලි කෝලම ය.
(4) මුදලි කෝලම සහ පොලිස් කෝලම ය.

34. ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි නාට්‍ය නිෂ්පාදනයෙහි ලා පුරෝගාමී ව කටයුතු කර ඇත්තේ,
(1) නියුමාන් ජුබාල් ය.
(2) ඊ. එෆ්. සී. ලුඩොවයික් ය.
(3) රුවන්ති ද චිකේරා ය.
(4) ජෙරම් ලක්ෂ්මන් ද සිල්වා ය.

35. 'රාවනේසන්' දෙමළ වේදිකා නාට්‍යය ලියා ප්‍රථම වරට නිෂ්පාදනය කරන ලද්දේ,
(1) එස්. මෞනගුරු විසිනි.
(2) එස්. විද්‍යානන්දන් විසිනි.
(3) කාර්තිගේසු සිවතම්බි විසිනි.
(4) කුලන්දෙයි ෂන්මුගලිංගම් විසිනි.

● අංක **36** සිට **40** තෙක් **නොගැළපෙන** වරණය තෝරන්න.

36. රංගාලෝකය
(1) නළුවන් පැහැදිලි ව දැකගැනීමට උපකාරී වේ.
(2) නාට්‍යයේ ශෛලිය ඉස්මතු කිරීමට ඉවහල් වේ.
(3) කිසියම් දර්ශනයකින් ඉස්මතු වන භාවය තීව්‍ර කිරීමට සමත් වේ.
(4) කිසියම් දර්ශනයක් සිදුවන කාලවේලාව දැක්වීමට උපකාරී වේ.

37. නළුවකු සතුව තිබිය යුතු ගුණාංග හා ලක්ෂණ අතරට අයත් වන්නේ,
(1) සහජ හැකියාව ය.
(2) සබ කෝලය දුරු කළ තැනැත්තකු වීම ය.
(3) සුන්දර රූ සපුවක් තිබීම ය.
(4) මනා ධාරණ ශක්තියක් තිබීම ය.

38. නාට්‍ය පෙළක් රචනා කිරීමේ දී,
(1) හේතු-ඵල සම්බන්ධතාව රැකෙන පරිදි සිද්ධි තර්කානුකූල ව ගැළපිය යුතු ය.
(2) චරිත, අවස්ථා හා සිද්ධි අතර ගැටුම් නිර්මාණය කළ යුතු ය.
(3) රංගනය සඳහා ම වූ චරිත ඇතුළත් කළ යුතු ය.
(4) තෝරාගනු ලබන සියලු අත්දැකීම් සුන්දර විය යුතු ය.

39. නාට්‍යයක යොදා ගනු ලබන පසුතල නිර්මාණ,
(1) සංකේතාත්මක අයුරින් යෙදිය හැකි ය.
(2) සැහැල්ලු ද්‍රව්‍ය යොදා නිර්මාණය කළ යුතු ය.
(3) සැබෑ ජීවිතයේ දී භාවිත වන දේවලින් ම සකසාගත යුතු ය.
(4) පහසුවෙන් සවි කිරීමටත් ගැලවීමටත් හැකි වන අයුරෙන් සකස් කළ යුතු ය.

40. නූර්ති සමඟ බිහි වූ ස්ථිර රංග ශාලාව වූයේ,
(1) ජෝන් ද සිල්වා සමරු රඟහල ය.
(2) එල්ෆින්ස්ටන් රඟහල ය.
(3) ටවර් රඟහල ය.
(4) ලයනල් වෙන්ඩ්ට් රඟහල ය.

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**50 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2014 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2014 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2014

නාට්‍ය හා රංග කලාව I, II
நாடகமும் அரங்கியலும் I, II
Drama and Theatre I, II

## නාට්‍ය හා රංගකලාව II

✻ **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

1. පහත දැක්වෙන සංවාද ඛණ්ඩය කියවා, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**ගම මහතා** : (ඉලත්තට්ටුව පිළිගන්වමින්) කපු මහත්තයා අත ගහපු දෙයක් ආයේ ඉතින් බලන්න ඕනෑ නැති බව දන්නේ නැතිවයැ.

**කපුරාළ** : දැන් ඉතින් සේරම හරි. හැබැයි මෙතෙක් දෙනවා කියපුවා ඔක්කෝම කිසිම අඩු පාඩුවක් නැතිව දෙන්න ඕන.

**ගම මහගේ** : අපේ ඉතින් වචන දෙකක් තියෙනවයැ කපු මහත්තයෝ ... කිව්වොත් ඉතින් කිව්වමයි. එහෙනම් අපි නැකත් දිනයක් තීරණය කර ගනිමු.

(ශබ්දයක් ඇසෙයි. කෝට් එකක් ඇඳගත් නරියා ගෙට ඇතුළු වී පසෙකට වෙයි. සියල්ලෝ පුදුම වී එකිනෙකාගේ මුහුණ බලති.)

**කපුරාළ** : (පුදුමයෙන්) මොකෙක් ද යකෝ ඒ.

**ගමරාළ** : නරියෙක් වගේ ... කෝට් එකකුත් දාගෙන ... පුදුමයි.

**කපුරාළ** : මොනවා ! කවුරුවත් වෙස් මුහුණක්වත් දාගෙන කොලොප්පමක්වත් ද දන්නෙ නෑ. (නරියා දෙසට හැරී, රැල් බුරුල් හැර)

හ ඃ ... ආ ... මේ ... මොක ද?

**නරියා** : නෑ මං මේ නිකං පොඩි ගනුදෙනුවක් ගැන කතා කරගන්න ආවා ... කමක් නෑ මට පරක්කු උනාට... ඔහෙලගෙ කතා බහ ඉවර කරගන්නකො.

**කපුරාළ** : (පුදුම වී) නරියෙක් නේන්නම්.

**ගම මහගේ** : අනේ මටනම් බයේ බෑ මල පිල්ලියක්වත් ද දන්නෙ නෑ.

(i) මේ අවස්ථාවේ දී නළු-නිළියෝ කී දෙනෙක් වේදිකාවේ සිටිත් ද? (ලකුණු 01 යි)

(ii) ඉලත්තට්ටුව යනු කුමක් ද? (ලකුණු 01 යි)

(iii) ඉලත්තට්ටුවෙන් පිළිගන්වන, හැපිමට දෙන දේවලට අයත් ප්‍රධාන අංග **හතර** මොනවා ද? (ලකුණු 01 යි)

(iv) නරියා පැමිණීමට පෙර ගෙදර පැවැතියේ කවර ආකාරයේ සාකච්ඡාවක් ද? (ලකුණු 01 යි)

(v) අඩු පාඩු නැති ව දෙන්ට ඕන යැයි කියන්නේ මොනවා ගැන ද? (ලකුණු 01 යි)

(vi) මෙහි වරහන් තුළ දී ඇති වචන නාට්‍ය පිටපතක හඳුන්වන්නේ කවර නමකින් ද? (ලකුණු 01 යි)

(vii) රැල් බුරුල් හරිනවායැයි කියන්නේ කුමක් ද? (ලකුණු 01 යි)

(viii) ස්ථිර ව ම කරනවා යන්න මෙහි දක්වනු ලැබ ඇත්තේ කවර ලෙසින් ද? (ලකුණු 01 යි)

(ix) නිවසේ සියල්ලන් ම පුදුම වී බලන්නේ කුමක් නිසා ද? (ලකුණු 01 යි)

(x) 'මල පිල්ලිය' යනු කුමක් ද? (ලකුණු 01 යි)

(xi) නරි බෑණා නාට්‍ය රචකගේ තවත් නාට්‍ය **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

[ හයවැනි පිටුව බලන්න.

**2.** (i) දක්ෂිණ භාරතීය සංගීතය මූලික කරගත් දේශීය ගැමි නාටක විශේෂය නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) උක්ත ගැමි නාටක විශේෂයේ රංග භූමිය ඇඳ විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iii) මෙම ගැමි නාටකයේ රංග ශෛලිය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**3.** ප්‍රථම වරට නාට්‍යශාස්ත්‍ර නම් ග්‍රන්ථයෙහි දැක්වෙන අයුරු ප්‍රධාන නාට්‍ය ශෛලීන් දෙකක් වේ.

(i) එම ශෛලී **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) එම නාට්‍ය ශෛලීන්ගේ විශේෂතා උදාහරණ සහිත ව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) එම ශෛලීන් දෙකට අයත් නාට්‍ය **දෙකක්** නිදසුන් වශයෙන් ගෙන, චරිත නාම සහිත ව ඒ ඒ ශෛලිය ප්‍රකට කළ ආකාරය විස්තර කරන්න. (ලකුණු 06 යි)

**4.** (i) පහතරට ප්‍රදේශයේ ප්‍රචලිත ශාන්තිකර්ම **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) එයින් **එක්** ශාන්තිකර්මයක අන්තර්ගත රංග අවස්ථාවක් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iii) ශාන්තිකර්මයත් ජන නාට්‍යයත් අතර ඇති වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**5.** (i) නාට්‍යයක් ගොඩනැංවීමේ කාර්යයෙහි ප්‍රමුඛයා වන්නේ කවරෙක් ද? (ලකුණු 02 යි)

(ii) වේදිකා නාට්‍යයක් සඳහා යොදාගන්නා ආනුෂංගික කලා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) ඔබට නාට්‍යයක් වේදිකාගත කිරීමේ කාර්යය පැවරුණහොත් ඔබ අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙළ අනුපිළිවෙළින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**6.** (i) වේෂභූෂණ නිර්මාණය කරන ශිල්පියා හැරුණු කොට, වේදිකාව තුළ තත්ත්වානුරූපී මායාව මැවීම පිණිස දායක වන ආනුෂංගික ශිල්පීන් **හතර දෙනකු** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) වේෂභූෂණ නිර්මාණයේ දී ශිල්පියා සැලකිලිමත් විය යුතු කරුණු **හතරක්** දක්වන්න. (ලකුණු 04 යි)

(iii) ලෝකධර්මී හා නාට්‍යධර්මී යන ශෛලීන් දෙකට ම අයත් නාට්‍ය **දෙකක්** සඳහා **වේෂභූෂණ සැකසීමට ඔබට** අවස්ථාව සැලසිණි නම්, ඔබ අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**7.** පහත දැක්වෙන කතා සැකිල්ල ඔබට කැමති පරිදි අවසානයක් කරා ගෙනයමින් නාට්‍ය පෙළක් රචනා කරන්න. මෙහි දී ඔබට අවශ්‍ය පරිදි චරිත සංඛ්‍යාව අඩු වැඩි කරගත හැකි ය.

(සැ.යු. මෙය මහාවංසයේ සඳහන් වන සත්‍ය සිද්ධියකි. එහෙත් කතාවේ අවසානය ඔබට අභිමත පරිදි වෙනස් කළ හැකි ය.)

ක්‍රි. ව. තුන්වන සියවසේ ලංකාවේ රජ කළ මහසෙන් රජතුමා සංඝමිත්‍ර නම් තෙරුණුවක හා සෝණ නම් දුෂ්ට ඇමතියකුගේ බස් අසා මහායානය වැළඳගෙන ථෙරවාදී මූලස්ථානය වූ මහාවිහාරය විනාශ කිරීමට පියවර ගත්තේ ය. මහාවිහාරවාසී භික්ෂූන්ට දන්දීම ද තහනම් කළේ ය. මේ හේතුකොටගෙන රජතුමාගේ කුළුපග මිත්‍රයා වූ මේඝවර්ණාභය නම් ඇමතියා රජු සමග උරණ වී රජු හා සටන් කිරීම පිණිස මලය (කඳුරට) දේශයට ගොස් සේනාවක් රැස් කළේ ය. එය ඇසූ මහසෙන් රජතුමා ද ඔහුට මුහුණ දීම පිණිස තම සේනාව ද රැගෙන දකුණට ගියේ ය. දෙදෙනා ගේ ම හමුදා දුරතිස්සක නම් වැවේ දෙපැත්තේ කඳවුරු බැඳ පසුදා සටනට සූදානම් ව සිටියහ. කඳුරට හරහා දකුණට එද්දී මේඝවර්ණාභය හට දඩමස් මුලක් හා පිරිසිදු වතුර ද ලැබී තිබිණ. එදින රාත්‍රියේ ආහාර ගැනීමට සූදානම් වූ මේඝවර්ණාභය එහා ඉවුරේ සිටින රජතුමා සිහි වී “මගේ මිත්‍ර රජතුමා සමග බෙදා නො ගෙන මෙම ආහාරය අනුභව නො කරමි”යි සිතාගත්තේ ය. ...

(i) නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය සඳහා (ලකුණු 04 යි)

(ii) සංවාද හා රංග විධාන සහිත ව පෙළ රචනා කිරීම සඳහා (ලකුණු 08 යි)

* * *